SriLankan Airlines

oneworld

# වරාය, නාවික සහ ගුවන් සේවා අමාත්‍යංශය

ශ්‍රීලංකන් ගුවන් සමාගම, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළ, කටුනායක, ශ්‍රී ලංකාව

**ප්‍රසම්පාදන අංකය : COM/WL/RFP/23/02**

**ශ්‍රීලංකන් ගුවන් සමාගම විසින් පුළුල් බඳ සහිත ගුවන් යානා දෙකක් (2) වෙනුවෙන් මාස හයක (6) කාල සීමාවක් සඳහා තෙත් බදු යෝජනා කැඳවීම.**

වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශයේ අමාත්‍ය මණ්ඩල ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ සභාපතිවරයා විසින් ශ්‍රීලංකන් ගුවන් සමාගම වෙනුවෙන් එක හා සමාන යානා දෙකක් (2) මාස හයක (6) කාලයට තෙත් බදු පදනම මත ලබා දීම සඳහා සුදුසුකම් ලත් ලංසුකරුවන්ගෙන් ලංසු කැඳවනු ලබයි.

ඊට අදාළ යෝජනා සඳහා ඉල්ලීම (RFP) (2023) සැප්තැම්බර් (25) දින සිට ශ්‍රීලංකන් ගුවන් සමාගමෙහි නිල වෙබ් අඩවියෙන් (**https://www.srilankan.com/en_uk/corporate/tender-notices**) ලබාගත හැක.

ශ්‍රී ලංකා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව, ජාත්‍යන්තර තරඟකාරී ලංසු තැබීමේ ICB ප්‍රසම්පාදන ක්‍රමය හරහා ලංසු තැබීම සිදු කෙරනු ඇත. තෙත් බදු ගුවන් යානා සඳහා නීත්‍යානුකූල හිමිකම් ඇති ඊට උනන්දුවක් දක්වන සියලුම සුදුසුකම් ලත් ලංසුකරුවන්ට තම ලංසු **revenuemanagement@srilankan.com** යන ආරක්ෂිත විද්‍යුත් තැපැල් ලිපිනයට ඉදිරිපත් කළ හැකිය. යෝජනා සඳහා වන ඉල්ලීම් පරිශීලන කේතය වන COM/WL/RFP/23/02 යොමුවෙහි දක්වා ඇති පරිදි 2023 ඔක්තෝබර් 09 වන දින ශ්‍රී ලංකා වේලාවෙන් පැය 1400 (GMT + 0530)ට ලංසු ඉදිරිපත් කිරීම අවසන් වේ.

යෝජනා සඳහා වන ඉල්ලීමෙහි (RFP) හි අමුණා ඇති නිසි පරිදි අත්සන් කරන ලද ලංසු පිළිගැනීමේ පෝරමය සම්පූර්ණ කර **rminfo@srilankan.com** වෙත විද්‍යුත් තැපෑලෙන් ආපසු එවිය යුතුය. යෝජනා සඳහා වන ඉල්ලීම (RFP) පිළිබඳ ඕනෑම විමසීමක් හෝ පැහැදිලි කිරීමක් 2023 ඔක්තෝබර් 04 හෝ ඊට පෙර **rminfo@srilankan.com** විද්‍යුත් තැපැල් ලිපිනය හරහා ලබා ගත හැක.

2023 ඔක්තෝබර් 09 වැනි දින ශ්‍රී ලංකා වේලාවෙන් පැය 1415 ට (GMT+0530) ලංසු විවෘත කරනු ලබන්නේ යෝජනා සඳහා ඉල්ලීම (RFP) වෙත අතිරේකයක් හරහා හෝ වෙනත් ආකාරයකින් දක්වා නොමැති නම් පමණි. ප්‍රමාද වූ ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු විවෘත කිරීමට සහභාගී වීමට අදහස් කරන පාර්ශවයන් ලංසු විවෘත කරන දිනට දින තුනකට (3) පෙර **rminfo@srilankan.com** යන විද්‍යුත් ලිපිනය වෙත තම අභිප්‍රාය දැනුම් දිය යුතුය. යෝජනා සඳහා වන ඉල්ලීමට අදාළ යම් සංශෝධනයක් හෝ දැනුම්දීමක් වෙතොත් ශ්‍රීලංකන් ගුවන් සමාගමේ නිල වෙබ් අඩවිය හරහා එය දැනුම් දෙනු ලැබේ.

**සභාපති**
**අමාත්‍ය මණ්ඩල ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව**
**වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය**
**අංක 19, චෛත්‍ය පාර, කොළඹ 01, ශ්‍රී ලංකාව**